60

වගා සහනාධාර චක්‍රලේඛ අංක 35

මගේ අංකය: සං/වු.ආ/ප්‍රති ¥
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474, කොළඹ.03.
1991.05.20

ප්‍රාදේශීය කළමනාකරු,
ඌව/මහනුවර/නුවරඑළිය
සබරගමුව/ගාල්ල/මාතර

පාලු සැපයීමේ ආධාර ක්‍රමය යටතේ අසාර්ථක වූ
තේ ඉඩම් නැවත වගා ආධාර ක්‍රමය යටතේ
<u>සංවර්ධනය කිරීම</u>

පාලු සැපයීමේ ආධාර ක්‍රමය යටතේ පළමු ආධාර කොටස් ලබා තිබියදී අසාර්ථක වූ ඉඩම් නැවත වගාවට සහභාගි කර ගැනීමේ දී ඒ සඳහා ගෙවන ලද සියලුම මුදල් නැවත වගා ආධාර ක්‍රමය යටතේ 1, 2 සහ 3 වන වාරිකවලින් අඩු කර ගැනීම දැනට ක්‍රියාත්මකවන ක්‍රමය වේ. පාලු සැපයීම් ක්‍රමය යටතේ දෙවන වාරිකය ලබා ගැනීමෙන් පසුවද නියමිත කාලයක් තුල අස්වැන්න ලබා ගැනීමට පෙර ඇතැම් ඉඩම්වල තේ වගාව අසාර්ථකවී ඇති බව වාර්තා වී ඇති බැවින් ඒ සඳහාද සහනයක් සැලසීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත් කරන ලදුව වැවිලි සේවා ගරු ඇමතිතුමාගේද එකඟත්වය ඇතිව පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට විධි විධාන යොදා ඇත.

1. ඉල්ලුම්කරු සතු මුලු බිම් ප්‍රමාණය අක්කරයක් හෝ එයට අඩු නම් එම ඉඩම් නැවත වගා ආධාර ක්‍රමයට සහභාගිවන විට පාලු සැපයීම යටතේ කලින් ලබා ගෙන ඇති මුදල් ආපසු අය කර නොගැනීමේ පදනම මත නැවත වගා වට අවසරදීමට පුලුවන. මෙම ක්‍රමය <u>ඌව, මහනුවර, නුවරඑළිය, සහ සබරගමුව ප්‍රදේශවලට පමණක් සීමා විය යුතුය.</u>

2. මුලු බිම් ප්‍රමාණය අක්කරයකට වඩා වැඩිවූ ඉඩම් හා ඉහත 1 හි දැක්වූ ප්‍රදේශවලට පිටස්තරවූ අක්කර 1 ට අඩු ඉඩම් ද නැවත වගා ආධාර ක්‍රමයට සහභාගිවීමේ දී කලින් සැපයීමේ ආධාර ක්‍රමය යටතේ ලබා ඇති සම්පූර්ණ මුදල නැවත වගා ආධාර ක්‍රමය යට 1, 2 සහ 3 වැනි වාරිකවලින් සමාන කොටස් වශයෙන් අඩු කර ගැනීමේ පදනම මත නැ වගාවට අවසරදීමට පුලුවන. <u>මෙය සියලුම ප්‍රදේශ සඳහා අදාළ වේ.</u>

3. නැවත වගා කිරීම සඳහා අවසරදීමට පෙර මූලික පරීක්ෂණ අවස්ථාවේ දී පැරණි වගාව අසාර්ථකවීමට හේතුව පැහැදිලිව සොයා බැලිය යුතුය. මතුපිට පසේ පිහිටි ගල්, තද ස්ථර, ජලය, රඳා සිටින ස්ථාන හෝ මුල් රෝග සහිත බිම් කොටස් පිළිබඳව විශේෂයෙ පරීක්ෂාකාරී විය යුතුය. 90.02.28 දිනැති වගාආධාර චක්‍රලේඛ අංක 26 මෙහි සඳහන් පරිදි නැවත සංශෝධනය කරනු ලැබේ.

(ආචාර්ය සරත් බී මනතවත්ත)
සභාපති

පිටපත්:-
1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන/ව්‍යාප්ති/මුදල්)
2. අභ්‍යන්තර විගණක
3. සහකාර සාමාන්‍යාධිකාරි (පාලන/පිරිස්)
4. සහනාධාර නිලධාරීන් - උප කාර්යාල
5. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්

ශ්‍රී/05/15